# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2096/66 - 2018 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2018.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් 2018 නොවැම්බර් මස 05 දිනැති අංක 2096/18 සහ 2018 නොවැම්බර් මස 07 දිනැති අංක 2096/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රවල පළ කරන ලද නිවේදන, 2018 නොවැම්බර් මස 09 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2018 නොවැම්බර් මස 09 වන දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

(1) (අ) අංක 2096/18 දරන නිවේදනයෙහි "අංක (1) ජාතික සමගිය, සහජීවනය හා මුස්ලිම් ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ආ) එම නිවේදනයෙහි "අංක (2) තරුණ, කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ඇ) එම නිවේදනයෙහි "අංක (3) ජනමාධ්‍ය හා ඩිජිටල් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරීමෙන්;

(2) (අ) අංක 2096/26 දරන නිවේදනයෙහි "අංක (1) ඛනිජ තෙල් සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන I වන, II වන සහ III වන තීරු යටතේ වන අයිතමයන් ඉවත් කිරීමෙන්;